# 9 ශ්‍රේණිය සිංහල

## 02 ඒකකය - 2022

# ලප සේ සඳ විලසේ



සැකසුම - හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

09 ශ්‍රේණිය පෙළ පොත අභ්‍යාස සහ පිළිතුරු ද ඒකකයට අදාළ ආදර්ශ ප්‍රශ්න පත්‍ර 02ක් සහ පිළිතුරු ද අන්තර්ගත කර ඇත.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

# 02. ලප සේ සඳ විලසේ



සාහිත්‍යය යනු භාෂාව මාධ්‍ය කොට ගෙන හැඟීම් ප්‍රබලාකාරයෙන් දැනවීම සඳහා මානවයා ගොඩනගා ගත් මාර්ගයකි. ගද්‍ය, පද්‍ය හා චම්පු යනුවෙන් සාහිත්‍යයේ ප්‍රධාන ප්‍රභේද තුනකි.

සහජ කවිත්වයත් පෘථුල සංස්කෘතික විඥානයත් සහිතව සම්භාව්‍ය සාහිත්‍යයෙන් බැහැර වූ සාහිත්‍ය ධාරාවක් ද පැතිර ආවේ ය. "වෙස්සන්තර ජාතක කාව්‍යය" ඒ ධාරාවේ මුල් පෙළේ කෘතියකි. මේ පාඩමට ඇතුළත් වන්නේ එයින් උපුටා ගත් කවි කිහිපයකි.

**අවබෝධය**

1. මේ කවිවල තේරුම ඔබේ වචනයෙන් ලියන්න.
2. කවිවල අලංකාරය වැඩි කිරීම සඳහා යොදා ගෙන ඇති උපමා දෙකක් ලියන්න.
3. මව දරුවන් පෝෂණය කිරීමට ගත් වෙහෙස දැක්වෙන කවි පද උපුටා දක්වන්න.
4. අම්මා වෙනුවෙන් මේ දරුවන් දෙදෙනා විසින් කළ ප්‍රාර්ථනාවන් ඇතුළත් කවි පද තෝරා ලියන්න.
5. මෙම පද්‍ය පන්තිය පිළිබඳ ඔබේ අදහස කෙටියෙන් ලියන්න.
6. මේ පද්‍ය පන්තියේ ඇතුළත් ගැමි වහරින් උපුටා ගත් යෙදුම් පහක් ලියන්න.

- **අවබෝධය**

**1.**

I. අප සතුව තිබූ රටත් වස්තු සම්භාරයත් අනෙකුත් සියල්ලත් අතහැර දමා ඒ කෙරෙහි ආශාවක් නොමැතිව ඔබත් සමඟ තපසට පැමිණ, තරු පිරිවරා ගත් සඳක් මෙන් මේ වනයෙහි වෙසෙන්නා වූ අපේ මවුතුමිය වෙස්සන්තර පිය රජුනි, ඔබට බාරයි.

II. වනයට පැමිණි දා සිට මෙත් සිතින් යුතුව ඔබතුමාට වත් පිළිවෙත් කරමින් සමගියෙන් අපි ජීවත් වුණෙමු. අපගේ මවට ඔබ හැර වෙන රැකවරණයක් නැත. අප දන් දුන් පිනෙන් කිසිම බාධාවක් නැතිව මතු බුදු වන්න.

III. සඳේ ලප වගේ දවසක් වත් වෙන් නොවී අපත් සමගම සිටිමින් පසේ බුදු කෙනෙකුන් මෙන් නිරතුරුව ම අපේ මව අප රැක ගත්තා ය. අපේ මව අපව බිහි කර හදා වඩා ගත් හෙයින් ඔබ අපව සිත් සේ දන් දෙන්නේ ය. ඉතින් අප දන් දුන්නාක් මෙන් අපගේ මවව දන් නොදෙන්න.

IV. රස කිරි පොවා ආදරයෙන් අප ඇති දැඩි කළ අපේ මව, අපගේ කුසගිනි නිවීමට පලවැල ද ගෙනැවිත් දුන්නා ය. එදින අප සමඟ වංකගිරියට පැමිණියා වූ අපේ මවට සදෙව් (දිව්‍ය ලෝක හය) ලෝකයේ ම ඉපිද දිව්‍ය සැප විඳ නිවන් දකින්නට ලැබේවා!

V. ප්‍රේමාදර සුරතල් බස් කියමින් දෙතනේ කිරි පෙවූ අම්මා පැමිණ, අප නොදැක, හඬ හඬා කඳුළු වගුරවමින් දුක වාවා ගන්නේ කෙසේ ද? සම්මා සම්බුදුන් පහළ වූ විට මවුනි, ඔබ නිවන් දකීවා!

VI. හැට දහසක් තරම් රජවරුන් අතර උපන්, දහස් ගණනක් වූ කිසිම රටක රාජ්‍යයක දක්නට නොහැකි තරම් වූ ඔබේ උසස් ගතිගුණ කටවල් දහස් ගණනකින් කීවත් කියා නිම කළ නොහැකි ය. එසේ වූ අපේ අම්මා ගව් දහස් ගණනක් ඈත වනයේ ගියා ද?

VII. දස මසක් කුසේ දරා දුක් විඳිමින් අප බිහිකර, අංජන කල්කය ගල්වා අපව ඇති දැඩි කළා වූ ද, රසවත් පලවැල නෙලා ගෙනවිත් දෙමින් අපව පෝෂණය කළා වූ ද, අපේ අම්මා, සතර අපාවල නොවැටී නිවන් දකීවා!

VIII. අහසේ තරු තරමටත් වඩා මහත් වේදනාවක් විඳ දරා ගනිමින් අපව බිහි කළා වූ ද, ගසක එල හටගන්නා තරම් මහත් වූ විශාල සංඛ්‍යාවක් දොඩම් කැව්වත් සෑහීමකට පත් නොවූවා වූ ද, සාගරයේ මහා දියකඳ තරම් මව්කිරි පෙව්වත් සෑහීමකට පත් නොවූවා වූ ද, අපේ අම්මා සතර අපායේ නොවැටී නිවන් දකීවා!

2.

- ✓ ලප සේ සඳ විලසේ
- ✓ එප සේ බුදු කෙනෙකුන් මෙන්

**3.**

- ✓ අඬා විඩා හැර පලවැල ගෙන දුන්දැයි නිති නේ
- ✓ රස පලවැල නෙලා දිදී රස්සා කළ අම්මා
- ✓ ගසක දොඩම් මදෙයි කියා කෑ දැයි අපෙ අම්මා

**4.**

- ✓ වඩා සදෙව් ලොව සැප විඳ නිවන් දකින් සොඳි නේ
- ✓ සම්මා සම්බුදු වෙනදා නිවන් දකින් අම්මා
- ✓ සතර අපාවල නො ඉපද නිවන් දකින් අම්මා
- ✓ සතර අපායේ නො වැටී නිවන් දකින් අම්මා

**5.** සම්භාව්‍ය සාහිත්‍යයෙන් බැහැර වූ, සහජ කවිත්වයෙන් යුත් සිංහල ගැමි කවියා විසින් රචනා කරන ලද කවි වලින් යුත් මෙම පද්‍ය පන්තිය මව් සෙනෙහස සහ දරු සෙනෙහස මැනවින් නිරූපණය කරන, සරල භාෂාවකින් රචනා කරන ලද අගනා කවි පංතියක් බව හැඟේ.

**6.**

- ✓ හිමයේ
- ✓ වංගගිරිය
- ✓ වම්මා
- ✓ දහසක් ගව්
- ✓ රස්සා
- ✓ විලි ලූ
- ✓ මදෙයි

## සමානාර්ථ පද සහ විරුද්ධාර්ථ පද

❖ **සමානාර්ථ පද** - එක් පදයකට සමාන තේරුම් ඇති වෙනත් පද සමානාර්ථ පද හෙවත් පර්යාය පද ලෙස හැඳින්විය හැකි ය.

- ✓ සඳ - චන්ද්‍ර, තරුපති, තාරපති, නිශාකර, සිසි, සොම්, හිමකර, තරිඳු
- ✓ ප්‍රසිද්ධ - පුවතර, පසිඳු, පතළ, ප්‍රකට, පරසිඳු
- ✓ පිපි - විකසිත, පුබුදු, පිබිදි, පුල්, පුප්, මිණිදැදිරි, මිණිමුතු
- ✓ සතුට - සොම්නස, සතොස, ප්‍රමෝදය, තුට, තොස, සන්තුෂ්ටිය, ආනන්දය, අමන්දානන්දය, ප්‍රහර්ෂය
- ✓ විශාල - විසල්, මහත්, තුමුල, මහා, පෘථුල, ලොකු
- ✓ ජලය - පැන්, උදක, අඹු, දිය, වතුර, නී
- ✓ වනය - වනාන්තරය, කැලෑව, වල, අරණ, අටවි, මූකලාන, බැද්ද
- ✓ ගස - වෘක්ෂය, තුරු, රුක, පාදප, ද්‍රැම
- ✓ රන් - ස්වර්ණ, කනක, කාංචන, කසුන්, රත්තරන්
- ✓ මුහුද - සමුදුර, සයුර, සමුද්‍රය, රුවනාර, සිඳු, සාගරය, ජලනිධි, සින්ධු

❖ විරුද්ධාර්ථ පද - යම් කිසි පදයකට විරුද්ධ අර්ථයක් දෙන පදය විරුද්ධාර්ථ පද ලෙස හැඳින්වෙයි. විරුද්ධාර්ථ පද සෑදෙන ප්‍රධාන ආකාර 03ක් හඳුනා ගත හැකි ය.

1. නාම පදයකට හෝ ක්‍රියා පදයකට ඉදිරියෙන් "නො" නිපාත පදය යෙදීමෙන්. උදාහරණ:-

- ✓ හැකි - නොහැකි
- ✓ කියන - නොකියන
- ✓ තෙමා - නොතෙමා
- ✓ සඟවා - නොසඟවා
- ✓ දුටු - නොදුටු
- ✓ කළ - නොකළ
- ✓ ගිය - නොගිය
- ✓ වරදින - නොවරදින
- ✓ නවතින - නොනවතින

2. නාම පදයකට හෝ ක්‍රියා පදයකට ඉදිරියෙන් උපසර්ග පද යෙදීමෙන් (අ, අව, නි, නු, නිර්, නිශ්/නිෂ්, දු, දුර්, දුශ්/දුෂ්, වි, කු ආදි උපසර්ග) උදාහරණ:-

I. අ උපසර්ගය

- ✓ ඝෝෂ - අඝෝෂ
- ✓ පිරිසිදු - අපිරිසිදු
- ✓ වංක - අවංක

II. නි උපසර්ගය

- ✓ වැරදි - නිවැරදි
- ✓ සරු - නිසරු
- ✓ දොස් - නිදොස්

III. නිර් උපසර්ගය

- ✓ ලෝභ - නිර්ලෝභ
- ✓ දෝෂ - නිර්දෝෂ
- ✓ වස්ත්‍ර - නිර්වස්ත්‍ර

IV. දු උපසර්ගය

- ✓ බල - දුබල
- ✓ සිරිත් - දුසිරිත්
- ✓ ගඳ - දුගඳ



V. අව උපසර්ගය

- ✓ මඟුල් - අවමඟුල්
- ✓ නම්බුව - අවනම්බුව
- ✓ ලස්සන - අවලස්සන

VI. නු උපසර්ගය

- ✓ සුදුසු - නුසුදුසු
- ✓ හුරු - නුහුරු
- ✓ පුරුදු - නුපුරුදු



VII. නිශ්/නිෂ්

- ✓ ශබ්ද - නිශ්ශබ්ද
- ✓ චල - නිශ්චල
- ✓ ඵල - නිෂ්ඵල

VIII. දුර්

- ✓ බල - දුර්බල
- ✓ ගුණ - දුර්ගුණ
- ✓ ජන - දුර්ජන

IX. දුශ්/ දුෂ්

- ✓ ශීල - දුශ්ශීල
- ✓ ප්‍රතිපත්ති - දුෂ්ප්‍රතිපත්ති
- ✓ කර - දුෂ්කර



X. කු

- ✓ කවි - කුකවි
- ✓ දිටු - කුදිටු
- ✓ පුරිස් - කුපුරිස්

XI. වි

- ✓ විදේශීය - විදේශීය
- ✓ පක්ෂ - විපක්ෂ
- ✓ යෝග - වියෝග

3. අන්‍ය පදයක් ඒ සඳහා භාවිත කිරීමෙන්
උදාහරණ:-

- ✓ එළිය - අඳුර
- ✓ කළු - සුදු
- ✓ අලුත් - පැරණි

## ලිඛිත අභ්‍යාස

1. පහත සඳහන් පදවලට සමානාර්ථ පද 03 බැගින් සොයා ලියන්න.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| i. | සිංහයා - | iv. | මව - | vii. | නෙලුම - | | |
| ii. | කාන්තාව - | v. | රංචුව - | viii. | දුක - | | |
| iii. | ගෙය - | vi. | දක්ෂ - | ix. | කුරුලු - | x. | රජ - |

2. ගැළපෙන විරුද්ධාර්ථ පද යොදා පහත වගුව සම්පූර්ණ කරන්න.

| නො-නිපාතය | අ-උපසර්ගය | අව-උපසර්ගය | නි-උපසර්ගය | දු-උපසර්ගය | අන්‍ය පද |
|---|---|---|---|---|---|
| යන - නොයන | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

- **ලිඛිත අභ්‍යාස**

**1.**

I. කේශර,කෙසර, මෘගපති, බාසුරු, සිහ.
II. වනිතාව, කත, ලිය, ලලනාව, මාගම.
III. නිවස, ගෘහය, විමන, විමානය, ඝරය.
IV. මෑණි, අම්මා, ජනනි, දිනිති, මාතෘ.
V. රැළ, රෑන, සමූහය, කල්ලිය, පෙළ, මුළ, වැළ.
VI. හපන් නිපුණ, හැකි, ජගත්, ශක්‍ය.
VII. පියුම, සියපත්, ශතපත්‍ර, තඹර, තාමර, තඹුරු
VIII. සොම්නස, ශෝකය, සොව, සංතාපය.
IX. සියොත්, විහඟ, පක්ෂි, සකල.
X. රජතුමා, නිරිඳු, නරපති, මිහිපල්, භූපති, මිහිපති

**2.**

I. යන - නො යන
පැමිණි - නො පැමිණි
දැන - නො දැන
ගැඹුරු - නො ගැඹුරු
හැකි - නො හැකි

II. ගෞරවය - අගෞරවය
සමගිය - අසමගිය
ප්‍රකට - අප්‍රකට
කෘතඥ - අකෘතඥ
සම - අසම

III. සම්මාන - අවමාන
ශිෂ්ට - අවශිෂ්ට
ලස්සන - අවලස්සන
රූපක - අවරූපක
මඟුල - අවමඟුල

IV. වැරදි - නිවැරදි
දොස් - නිදොස්
සරු - නිසරු
හඬ - නිහඬ
වහල් - නිවහල්

V. සිරිත් - දුසිරිත්
බල - දුබල
සුදන - දුදන
සුගතිය - දුගතිය
සුලබ - දුලබ

VI. උඩ - බිම
අහස - පොළොව
උස් - මිටි
හොඳ - නරක
උත්තම - අධම



- **ප්‍රායෝගික අභ්‍යාස (Home Work)**

**ප්‍රායෝගික අභ්‍යාස**

1. මන්ද්‍රි දේවියට තම දරුවන් කෙරෙහි ඇති සෙනෙහස ඉස්මතු කරවන කවි පන්තියක් ගොඩ නගන්න.
2. පන්ති රැස්වීමේ දී මවුගුණ ගී රස වින්දන වැඩසටහනක් පවත්වන්න.

# ගුරු අත් පොතෙන්

1. දී ඇති පද අතුරෙන් සමානාර්ථ නො වන පදය තෝරන්න.
    - ආඩම්බරය - අහංකාරය, උඩඟුකම, අවමානය

2. මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථවත් පදය තෝරන්න.
    - උත්තීර්ණ- නිරාවරණය, අවතීර්ණ, අනුකරණය
    - අවම - අධම, ද්‍රාතම, උපරිම

3. පහත දැක්වෙන පදවලට විරුද්ධාර්ථවත් පද ත්‍රිකෝණය තුළ ඇති පද අතරෙන් තෝරන්න.

    I. ආරක්ෂිත -
    II. චාරිත්‍ර -
    III. ආර්ය -
    IV. අවරගිර -
    V. නින්දා -
    VI. සාර -
    VII. එලොව -
    VIII. නිත්‍ය -
    IX. සියුම් -
    X. සුහද -

රක්ෂිත
සාරවත්
පරලොව
මනා, බටහිර
අනාරක්ෂිත
ප්‍රශංසා
අසාර
අනිත්‍ය, මෙලොව,
දළ, චාරිත්‍ර
අනාර්ය, උදාගිර, දුහද

4. පහත දැක්වෙන පදවලට සමානාර්ථවත් පද ත්‍රිකෝණය තුළ ඇති පද අතරෙන් තෝරන්න.

    I. නුවණ -
    II. ප්‍රවීණ -
    III. උභය -
    IV. අනල -
    V. ජනනි -
    VI. දසන් -
    VII. පහණ -
    VIII. මිහිපා -
    IX. රජත -
    X. මුකුලිත -

දක්ෂ
උදාර
මව, උපත
ඥානය
දෙක, ගින්න
වාතය, දත්
ප්‍රතිචීන, දර්ශන, නයන
එළිය, මිහිකත
පාෂාණ, රිදී, විකසිත
මී මැස්සා, පරවුණු, අභය,රාත්‍රිය, රජ

# ගුරු අත් පොතෙන් - පිළිතුරු

1. ආඩම්බරය - අහංකාරය, උඩඟුකම, අවමානය
2. උත්තීර්ණ- නිරාවරණය, අවතීර්ණ, අනුකරණය
   අවම - අධම, දාතම, උපරිම
3.
   I. ආරක්ෂිත -
   II. චාරිත්‍ර -
   III. ආර්ය -
   IV. අවරගිර -
   V. නින්දා -
   VI. සාර -
   VII. එලොව -
   VIII. නිත්‍ය -
   IX. සියුම් -
   X. සුහද -



4.
   I. නුවණ -
   II. ප්‍රවීණ -
   III. උභය -
   IV. අනල -
   V. ජනනි -
   VI. දසන් -
   VII. පහණ -
   VIII. මිහිපා -
   IX. රජත -
   X. මුකුලිත -

## ගුණාත්මක යෙදවුම්



- සිංහල රචනය හා සාහිත්‍ය රසාස්වාදය
  - පී. තේනබදු
- සිංහල විරුද්ධාර්ථ පද කෝෂය
  - ඩබ්ලිව්. එස්. කරුණාතිලක
- සමානාර්ථ පද කෝෂය
  - ඩබ්ලිව්. එස්. කරුණාතිලක

| 9 ශ්‍රේණිය | සිංහල | ඒකකය : 2 |
|---|---|---|

## ලප සේ සඳ විලසේ - සමානාර්ථ පද හා විරුද්ධාර්ථ පද

### I කොටස

**පහත 1 - 10 දක්වා අසා ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු ලියන්න.**

1) සාහිත්‍යයේ ප්‍රධාන ප්‍රභේද තුන නම් කරන්න. .................................................. (තුනම ලියා ඇත්නම් ලකුණු 2යි.)
2) සම්භාව්‍ය සාහිත්‍ය සකස් වී ඇති කොටස් මොනවා ද? ..................................................
3) පැරණි සිංහල පද්‍ය නිර්මාණයට බොහෝ විට වස්තු විෂය වූයේ කුමක්ද? ..................................................
4) සම්භාව්‍ය සාහිත්‍යයෙන් බැහැර ව නිර්මාණය වූ සාහිත්‍ය ධාරාව හැඳින්වූයේ කුමන නමකින් ද? ..................................................
5) එම සාහිත්‍ය සම්ප්‍රදායට අයත් මුල් පෙළේ කෘතියක් නම් කරන්න ..................................................
6) ' ලප සේ සඳ විලසේ ' පාඩමට පාදක වූ කාව්‍ය නිර්මාණය කුමක් ද? ..................................................
7) එම කාව්‍ය නිර්මාණයට පාදක වූ ජාතක කථාව නම් කරන්න. ..................................................
8) එහි ප්‍රධාන චරිතය නම් කරන්න. ..................................................
9) එම ජාතක කතාවේ සඳහන් අනෙකුත් චරිත 2ක් ලියන්න. ..................................................
10) චම්පු කාව්‍ය යනු කුමක්ද? ..................................................

### II කොටස

**පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

1) දී ඇති වචනවල අර්ථය සඳහන් කරන්න.

I. සිය පිරිවර - ..................................................
II. නැතිනිම්මා - ..................................................
III. ලොබ හැර - ..................................................
IV. තරු පිරිවර - ..................................................
V. සම සිතින් - ..................................................
VI. වෙන් නුවෙම්මා - ..................................................
VII. වැවෙම් ද - ..................................................
VIII. රස්සා කළ - ..................................................
IX. අඬා විඩා හැර - ..................................................
X. නිතියෙම්මා - ..................................................

**2) පහත සඳහන් කවිය ඇසුරින් අසා ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

I. කවියේ දී ඇති හිස්තැන් සඳහන් කරන්න.

ලප සේ සඳ විලසේ දවසක් වෙන්නූ වෙම්වා

........................................................................................

........................................................................................

අප සේ පිය රජුනි දනට නො දෙන්නේ අපෙ අම්මා

II. මෙම කවියේ සඳහන් උපමාවක් ලියන්න.

........................................................................................................................................................................................

III. මෙහි ' පිය රජුනි ' යනුවෙන් ආමන්ත්‍රණය කරන්නේ කාටද?

........................................................................................................................................................................................

IV. මෙම කවියේ අර්ථය කෙටියෙන් ලියන්න.

........................................................................................................................................................................................

**3) දී ඇති පදවලට සමානාර්ථ පද තුන බැගින් ලියන්න.**

I) මුනිඳු - ........................................................................................................................................

II) ජලය - ........................................................................................................................................

III) රජ - ........................................................................................................................................

IV) සඳ - ........................................................................................................................................

V) අහස - ........................................................................................................................................

VI) ගස - ........................................................................................................................................

VII) මුහුද - ........................................................................................................................................

VIII) අම්මා - ........................................................................................................................................

IX) අනංගයා - ........................................................................................................................................

X) ගින්දර - ........................................................................................................................................

(ඉහත ප්‍රශ්න සඳහා වැරදෙන එක් පිළිතුරකට ලකුණු 1 ක් අඩුවේ)

4) පහත පදවලට විරුද්ධාර්ථය දෙන පදය ලියන්න.

I) මානය - ...............................................

II) සුදුසු - ...............................................

III) ගුණ - ...............................................

IV) ස්ථාවර - ...............................................

V) සුභාෂිත - ...............................................

VI) යෞවන - ...............................................

VII) බුද්ධිමත් - ...............................................

VIII) යාවජීව - ..............................................

IX) මුඵ - ..............................................

X) අහංකාර - ..............................................

**5) ඉරි ඇඳි පදයට සුදුසු විරුද්ධ පදය යොදා හිස්තැන් සම්පූර්ණ කරන්න.**

I. රැයෙහි විකසිත වන මල් දහවලෙහි .................................................. වේ.

II. උත්තම ගුණ ඇති මිනිසුන් මෙන්ම .................................................. ගති ඇත්තෝ ද සමාජයේ වෙති.

III. පාසලේ පැවති උත්සවයට ජ්‍යෙෂ්ඨ අංශයේ සිසුන් හා .................................................. අංශයේ සිසුන් සහභාගි විය.

IV. ක්‍රෝධය පිරි දෙනෙත් ඇති නාලාගිරි ඉදිරියේ .................................................. පිරි නෙතින් යුත් බුදු හිමියෝ වැඩ සිටි සේක.

V. කරන ලද කුසල් අකුසල් අනුව දුගතියක හෝ .................................................. අප උපදින බව හිමිපාණෝ වදාළ සේක.

VI. සිදු වූ අවමානය මග හැර ගනිමින් .................................................. ලබා ගැනීමට කටයුතු කරන්න යැයි මට උපදෙස් දුන්නාය.

VII. විත්ති පාර්ශවයේ හා ..................................................පාර්ශවයේ එකඟතාවය මත ආරවුල නිරාකරණය කර ගනු ලැබුණි.

VIII. අනපේක්ෂිත ව්‍යසනය නිසා අසරණ වූ ගම්වැසියන්ට .................................................. වීමට බොහෝ දෙනා ඉදිරිපත් වූහ.

IX. මන්දපෝෂණය නිසා මෙන්ම .................................................. නිසා ද පීඩිත දරුවෝ ලොව වෙසෙති.

X. දියුණුවේ හිනිපෙත්තේ සිටින බොහෝ මිනිසුන් වෙත මිහිරි අත්දැකීම් වලට වඩා ඇත්තේ .................................................. අත්දැකීම් ය.

6) විරුද්ධ පද යා කරන්න.

| | | |
|---|---|---|
| I. | ස්වාභාවික | විකසිත |
| II. | උදක | විදේශීය |
| III. | සංකීර්ණ | අශිෂ්ට |
| IV. | මුකුලිත | විරාගී |
| V. | ශීඝ්‍රගාමී | දුරාචාර |
| VI. | සදාචාර | කෘත්‍රිම |
| VII. | පුරපස | මන්දගාමී |
| VIII. | ශිෂ්ට | නිරුදක |
| IX. | ස්වදේශීය | විකසිත |
| X. | රාගී | අවපස |

**7)** **' අ ' කොටසේ සමාන පදවලට ගැළපෙන සමාන පදය ' ආ ' කොටසින් තෝරා හිස්තැන මත ලියන්න.**

| අ | ආ |
|---|---|
| ධවල<br>චක්ෂු<br>පුණ්ඩරීක<br>අගල, අඳුර, සකි,<br>සකුණ, ධරණී, වුවන,<br>නිල්ගල, ගොනඟුල්,<br>දිගැසි, පුෂ්කරණී, තිදස්පති,<br>පිළිමල්, ලෝහිත, උදුල,<br>දිවාකර, ඉන්ද්‍රචාප, කග | පිහි<br>පබසර<br>දියනෙත<br>මාගම, නේත්‍ර<br>වක්ත්‍රය, පිල්බර<br>සියොත්, ස්වේත<br>සුරසැව්. රුහිරු<br>සාමුව, පංකජ, තිමිර<br>අග්නි, කලණ, පද්මාකර<br>සුරපති, ප්‍රතිමල්ලවයා |

| | |
|---|---|
| i) ............................................................ | xi) ............................................................ |
| ii) ............................................................ | xii) ............................................................ |
| iii) ............................................................ | xiii) ............................................................ |
| iv) ............................................................ | xiv) ............................................................ |
| v) ............................................................ | xv) ............................................................ |
| vi) ............................................................ | xvi) ............................................................ |
| vii) ............................................................ | xvii) ............................................................ |
| viii) ............................................................ | xviii) ............................................................ |
| ix) ............................................................ | xix) ............................................................ |
| x) ............................................................ | xx) ............................................................ |

2 පාඩම

මීගමුව අධ්‍යාපන කලාපය


සිංහල භාෂාව හා සාහිත්‍යය

9ශ්‍රේණිය

" ලප සේ සඳ විලසේ "



- " වෙස්සන්තර ජාතක කාව්‍ය" නමින් සිංහලයන් අතර ප්‍රකට, ජන කාව්‍ය සංග්‍රහයෙන් උපුටා ගන්නා ලද පද්‍ය කිහිපයක් මෙම පාඩමට ඇතුළත් වේ.
- වෙස්සන්තර රජතුමා බුද්ධත්වය පතා තම පුත් ජාලිය හා දූ ක්‍රිෂ්ණජිනාවන් ජූජක බමුණාට මෙහෙකාරකම උදෙසා දන් දුන් අවස්ථාවෙහි ඔවුන් කරන බැගෑපත් ඉල්ලීමක් සේ මෙය රචනා වී තිබේ. මේ අවස්ථාව වන විට වෙස්සන්තර රජුගේ බිසව වූ ද දෙ දරුවන්ගේ මව වූ ද මන්ද්‍රී දේවිය ආහාර උදෙසා පලවැල සෙවීමට වනාන්තරයට ගොස් සිටියාය.මෙහි වස්තු විෂය හෙවත් තේමාව එම අවස්ථාවයි.
- මෙම කවි පන්තිය කියවන දරුවන් කෙරෙහි අසීමිත කරුණා රසයක් ජනිත කරවයි.
- තමන් දන් දෙන්නා වූ පුණ්‍ය බලයෙන් බාධාවක් නොමැතිව බුදුවන්නැයි ප්‍රාර්ථනා කිරීම හා විශේෂයෙන් අම්මා ගැන කෙරෙන ඉල්ලීම නිසා මෙම කවි පන්තිය කරුණා රසයෙන් පිරි නිර්මාණයක් වී තිබේ.
- සාමාන්‍ය රසිකයා තුළ එක්තරා ශෝකයක් ද ප්‍රබුද්ධ රසිකයන් තුළ කරුණා රසයක් ද ජනිත කිරීමට මෙම කවි සමත් වී තිබේ .
- මිනිස් සිතේ ඇති වන හැඟීම් රසවත් ව සිතට කාවදින අයුරින් දැක්වීම උදෙසා මානවයා දුරාතීතයේ සිට යොදාගත් මාධ්‍යයක් වුයේ සාහිත්‍යයයි.




ලෙස කොටස් තුනකි.

- ගද්‍ය සාහිත්‍ය යනු නව කතා හා කෙටිකතා ය.

- පද්‍ය ය සාහිත්‍යය යනු හැම වර්ගයකටම අයත් කවියයි.
  එනම් -: සිව් පද, දෙපද, සඳැස්, නිසදැස්, සැහැලි යන ආදියයි.

- චම්පූ කාව්‍ය යනුවෙන් බහුලව යෙදෙන්නේ ගද්‍යය හා පද්‍ය සම්මිශ්‍රණයෙන් තාලානුකූල ව කියවිය හැකි සාහිත්‍ය විශේෂයයි.

  නිදසුනක් ලෙස පහත නිර්මාණ දැකිය හැකිය.

  - කුවේණි අස්න
  - සිහබා අස්න
  - විලාසිනියකගේ ප්‍රේමය(එදිරිවීර සරච්චන්ද්‍ර)

**අතීතයේ පටන් ම අපේ පද්‍ය සාහිත්‍ය සම්ප්‍රදායන් දෙකක් ඔස්සේ බිහි වී පෝෂණය වූ බව පෙනෙයි.**

(1)විදග්ධ සම්ප්‍රදාය හෙවත් සම්භාව්‍ය සම්ප්‍රදායය.

(උගතුන් වියතුන් විසින් රචිත පද්‍ය සම්ප්‍රදායයි.

උදා :- ගුත්තිලය, සංදේශ කාව්‍ය, කව්සිළුමිණ)

(2)පොදු ජන සම්ප්‍රදාය හෙවත් වූල සම්ප්‍රදාය.

(එනම් ජනකවි සම්ප්‍රදාය යි.සාමාන්‍ය ගැමියන් ගේ මුවින් නික්මුණු ලේඛනාරූඪ නොවූ පද්‍ය සාහිත්‍යය යි.)

- පාඩමේ සඳහන් කවිය ඇතුළත් වන්නේ ජන කවි සම්ප්‍රදායට හෙවත් පොදු ජන සම්ප්‍රදායටය. එනම් සාමාන්‍ය ගැමියන් ගේ මුවින් නික්මුණු ලේඛන නොවූ සම්ප්‍රදායයි. කවීත්වයෙන් යුත් අපේ ගැමියෝ නිරායාසයෙන් තම හැඟීම් කවියට රසවත් ව හා භාව පූර්ණ ලෙස නංවා ඇත.
- වෙස්සන්තර ජාතක කාව්‍යය ජනකවි සම්ප්‍රදායට අයත් මුල් පෙළේ නිර්මාණයකි.

➢ පාඩම ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

1. මෙම කවි පන්තියේ අලංකාරය සඳහා භාවිතා කර ඇති උපමා තෝරා ලියන්න.
2. තමන්ගේ මැණියන් වෙනුවෙන් දරුවන් කරන පැතුම කුමක් ද?
3. මෙහි සඳහන් මව දරුවන් හා ස්වාමියා සමග තපසට පැමිණියේ කුමක් අත්හැර දමමින් ද ?
4. දරුවන් විසින් තම පියාට කරන උත්තම පැතුම කුමක් ද?
5. දරුවන් දෙදෙනා පියාගෙන් කරන ඉල්ලීම කුමක් ද?
6. අම්මා දරුවන් කෙරෙහි තිබූ අසීමිත බැඳීම හෙළිවන කවි පද උපුටා දක්වන්න.
7. අම්මා දරුවන් සොයමින් ඇවිද ගියේ කොහේද?
8. අම්මා දරුවන් ඇති දැඩි කළ ආකාරය දැක්වෙන කවි පන්තිය උපුටා ලියන්න.
9. අම්මා දරුවන් ලැබීමේ දී විඳින ලද වේදනාව සමාන කර ඇත්තේ කුමකට ද?
10. මෙම පද්‍යය පන්තියේ ඔබ සිත් ගත් අවස්ථාවක් චිත්‍රයට නගන්න.

11. පහත වචන වල අර්ථ ලියන්න

- ලොබ = වත් පිළිවෙත් =
- ආදාරෙක = පලවැල =
- නිතිනේ = සොඳිනේ =
- පෙම්මා = වැවෙම්මා =
- දස මස = උසුලා =
- වැදූදැයි = අඳුන් තෙලින් =
- නිති = මදෙයි =
- හිමය = සමසිතින් =
- වංකගිරිය = සදෙව්ලොව =
- සතර අපාවල = විළි ලූ දැයි =

පැවරුම

1.මෙහි සඳහන් දරුවන් දෙදෙනා වන ජාලිය හා ක්‍රිෂ්ණජිනා ඔබ යැයි සිතා, පියා විසින් ඔබව දන් දෙන අවස්ථාවේ මව ගෙන් වෙන් වී යාමට සිදුවීම හේතුවෙන් ඔබට දැනෙන දේ වාක්‍ය කිහිපයකින් ලියන්න.
2.මෙම පැදි පෙළ ඇසුරෙන් අර්ථවත් දෙබසක් නිර්මාණය කරන්න.
3.මෙම කවි වල තේරුම ඔබේ වචනයෙන් ලියන්න.
4.මෙම පද්‍ය පන්තිය පිළිබඳ රසවින්දනයක් (විචාරයක්) ලියන්න.
5.මෙහි සඳහන් පද්‍ය අට පාඩම් කරන්න.තාලයට ගායනා කරන්න.

සැකසුම -: එච්.ඩී.ඩී.සමන්ලතා
අමන්ජලි පෙරේරා
බප / මීග දළුවකොටුව සාන්ත ආනා මහා විද්‍යාලය

# පිළිතුරු



Answer

## i කොටස

1. ගද්‍ය, පද්‍ය හා චම්පු
2. පාලි හා සංස්කෘත මෙන් ම දෙමළ සාහිත්‍යය ද ඇසුරෙන් සකස් වූවකි.
3. බුදු සිරිත හෝ බෝසත් සිරිත.
4. ජන සාහිත්‍යය
5. වෙස්සන්තර ජාතක කාව්‍යය
6. වෙස්සන්තර ජාතක කාව්‍යය
7. වෙස්සන්තර ජාතකය
8. වෙස්සන්තර රජතුමා
9. අම්මා(මන්ත්‍රී දේවිය), දරුවන් දෙදෙනා(ජාලිය සහ ක්‍රිෂ්ණාජිනා)
10. ගද්‍ය පද්‍ය මිශ්‍රණයෙන් තාලානුකූලව කියවිය හැකි සාහිත්‍ය විශේෂ.

## ii කොටස

1.

I. තම පිරිස
II. සම්භාරය/ නිමාවක් නැති
III. ආශාවක් නොමැතිව
IV. තරු පිරිවරා ගත්
V. සමගියෙන්
VI. වෙන් නොවී
VII. වාවා ගන්නේ කෙසේ ද?
VIII. පෝෂණය කළ
IX. ඇඬුම්, වේදනාවන් නැති කර
X. නිරතුරුව ම

2.

I. ලප සේ සඳ විලසේ දවසක් වෙන්නුවෙ මිමා
එප සේ බුදු කෙනෙකුන් මෙන් රැකිදැයි නිතියෙ මිමා
සැප සේ අප දන් දුන්නෙත් වැදුවෙන් වද අ මිමා
අප සේ පිය රජුනි දනට නො දෙන්නෙ අපෙ අ මිමා

II. ලප සේ සඳ විලසේ
එප සේ බුදු කෙනෙකුන් මෙන්

III. පියාට/ වෙස්සන්තර රජතුමාට

IV. සඳේ ලප වගේ දවසක් වත් වෙන් නොවී අපත් සමගම සිටිමින් පසේ බුදු කෙනෙකුන් මෙන් නිරතුරුව ම අපේ මව අප රැක ගත්තා ය. අපේ මව අපව බිහි කර හදා වඩා ගත් හෙයින් ඔබ අපව සිත් සේ දන් දෙන්නේ ය. ඉතින් අප දන් දුන්නාක් මෙන් අපගේ මවව දන් නොදෙන්න.

3.

I. බුදුන්, මුණිවර, තථාගත
II. දිය, උදක, අඹ
III. නරපති, නරදෙව්, මිහිඳු
IV. චන්ද්‍රයා, නිශාකර, තාරපති
V. ගුවන, නුබ, ගගන
VI. රුක, වෘක්ෂය, තුරු
VII. සිඳු සමුදුර, සයුර
VIII. මව මෑණි, ජනනි
IX. කුසුම්සරා, කුසුමසරා, කම්
X. අග්නි, ගිනි, අග, ගින්න, අනල

4.

I. අවමානය
II. නුසුදුසු
III. අගුණ
IV. අස්ථාවර
V. භාෂිත
VI. තලතුනා
VII. බුද්ධිහීන
VIII. තාවකාලික
IX. නුවණැති
X. නිරහංකාර

5.

I. මුකුලිත
II. අධම
III. කනිෂ්ඨ
IV. මෛත්‍රිය
V. සුගතියක
VI. සම්මානය
VII. පැමිණිලි
VIII. සරණ
IX. අධිපෝෂණය
X. අම්හිරි

6.

I. ස්වාභාවික - කෘත්‍රිම
II. උදක - නිරුදක
III. සංකීර්ණ - සරල
IV. මුකුලිත - විකසිත
V. ශීඝ්‍රගාමී - මන්දගාමී
VI. සදාචාර - දුරාචාර
VII. පුරපස - අවපස
VIII. ශිෂ්ට - අශිෂ්ට
IX. ස්වදේශීය - විදේශීය
X. රාගී - විරාගී

7.

I. ධවල - ස්වේත
II. චක්ෂු - නේත්‍ර
III. පුණ්ඩරීක - පංකජ
IV. අගල - අග්නි
V. අඳුර - තිමිර
VI. සකි - කලණ
VII. සකුණ - සියොත්

VIII. ධරණී - --------
IX. වුවන - වක්ත්‍රය
X. නිල්ගල - පිල්බර
XI. ගොනඟුල් - සාමුව
XII. දිගැසි - මාගම
XIII. පුෂ්කරණී - පද්මාකර
XIV. තිදස්පති - සුරපති
XV. පිළිමල් - ප්‍රතිමල්ලවයා
XVI. ලෝහිත - රුහිරු
XVII. උදුල - පබසර
XVIII. දිවාකර - දියනෙත
XIX. ඉන්ද්‍රචාප - සුරසැව්
XX. කග - පිහි



2 පාඩම

මීගමුව අධ්‍යාපන කලාපය

සිංහල භාෂාව හා සාහිත්‍යය

9ශ්‍රේණිය

" ලප සේ සඳ විලසේ "

1. ලප සේ සඳ විලසේ
   එප සේ බුදු කෙනෙකුන් මෙන්

2. වඩා සදෙව් ලොව සැප විඳ නිවන් දකින් සොඳිනේ
   සම්මා සම්බුදු වෙනදා නිවන් දකින් අම්මා
   සතර අපාවල නො ඉපද නිවන් දකින් අම්මා

3. සිය පිරිවර රටතොට හැම වස්තුව

4. බා දා නො ව ඔබ බුදු වන් අප දන් දුන් පිනිනේ

5. අප සේ පිය රජුනි දනට නො දෙන්නෙ අපෙ අම්මා

6. වදා වඩා රස කිරි දී ඇති කළදැයි පෙම් නේ
   අඬා විඩා හැර පලවැල ගෙන දුන්දැයි නිතිනේ

7. ගව් හිමයේ (ගව් දහස් ගණනක් ඈත වනයේ)

8. වදා වඩා රස කිරි දී ඇති කළදැයි පෙම් නේ
   අඬා විඩා හැර පලවැල ගෙන දුන්දැයි නිති නේ
   වඩා මෙඅප වංගගිරිය ආ අම්මා සඳි නේ
   වඩා සදෙව් ලොව සැප විඳ නිවන් දකින් සොඳි නේ

9. අහසේ තරු වලට

10. 

**11.**

I. ලෝභය
II. රැකවරණයක්
III. නිරන්තරයෙන්
IV. ප්‍රේමයෙන්
V. මාස දහයක්
VI. බිහි කළාදැයි
VII. නිරන්තරයෙන්
VIII. වනය
IX. අවුල් වූ මාර්ගය
X. අපායවල් හතර
XI. ඇප උපස්ථාන
XII. ගස් වල ගෙඩි
XIII. හොඳින්
XIV. වාවා ගන්නේ කෙසේ ද?
XV. දරාගෙන
XVI. අංජන කල්කයෙන්
XVII. මදි යැයි
XVIII. මෙත් සිතින්
XIX. දිව්‍ය ලෝක භය
XX. බිහි කළා වූ ද



අප උපකාරක පංතියේදී ලබා දෙන මෙම නිබන්ධනය ද ඇතුලු සිංහල ගණිතය සහ විද්‍යාව විෂය වලට අයත් මෙවැනි නිබන්ධන රාශියක් pdf ලෙස 3in1 Group එකෙන් ලබා ගත හැක.

සුවහසක් සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් වාණිජ අරමුණකින් තොරව සතුටින් ලබා දෙන නිබන්ධන නම වෙනස් කර අලෙවි කිරීමට කටයුතු නොකරන්න. පාසල් හෝ උපකාරක පංති සඳහා මෙම නිබන්ධනය යොදා ගත හැකිය. ඔබ විසින් ලබා දෙන Like එක Comment එක අපට ශක්තියකි.

අප 3in1 Youtube නාලිකාවෙන් ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සාකච්ඡා කිරීම නැරඹිය හැකිය.

ස්තූතියි !

හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)



3 in 1 youtube නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

එක් කණ්ඩායමකට සිසුන් 10ක් පමණක් බඳවා ගැනේ